# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/37 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය මට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ජේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මෙම නියෝග හදිසි අවස්ථා (පෞද්ගලික අංශයේ) විශේෂ දීමනා නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙම නියෝගවල කාර්යයන් සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා වන්නේය.

(2) මෙම නියෝගවලින් නියම බලධරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත ඒ බලධරයා විසින් පැවරිය හැකිය.

3. වෙන යම් ලිඛිත නීතියක හෝ වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් සේවා ගිවිසුමක කුමක් සඳහන්ව ඇත ද මෙම නියෝගවල විධිවිධාන වලංගුව බලපැවැත්විය යුතුය ; තවද ඒ අනුව, මේ නියෝගවල විධිවිධාන හා ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති වූ අවස්ථාවක ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම අභිබවා මේ නියෝගවල විධිවිධාන බලපැවැත්විය යුතුය.

4. (1) යම් කිසි කර්මාන්තයක, මාසය සඳහා සම්පූර්ණ ඉපයුම රුපියල් අටසියය නොඉක්මවන කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම මෙහි පහත දක්වා ඇති පදනම මත ගණනය කරන ලද දීමනාවක් 1974 අප්‍රේල් මාසය ද ඇතුලු එක් එක් මාසය වෙනුවෙන් 1974 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එම කම්කරුවාට ගෙවනු ලැබිය යුතුය :

(අ) එම කම්කරුවා, යම් ලිඛිත නීතියක් මගින් වැටුප හෝ වේතනය පාලනය කරනු ලැබ සිටින කම්කරුවකු වන අවස්ථාවක ඔහු, මාසික පරිමානයක් මත වැටුප් ගෙවනු ලබන කම්කරුවකු නම් මාසය වෙනුවෙන් එම කම්කරුවාට ලැබිය යුතු වැටුපෙන් හෝ වේතනයෙන් සියයට විස්සකට අඩු නොවන්නා වූ ද ඔහු, දෛනික පරිමානයක් මත වැටුප් ගෙවනු ලබන කම්කරුවකු නම් මාසයේ වැඩ කළ එක් එක් දිනය වෙනුවෙන් ඔහුගේ දෛනික වේතනයෙන් සියයට විස්සකට අඩු නොවන්නා වූ ද දීමනාවක් ;

එසේ වුව ද, මේ නියෝග යටතේ ගෙවිය යුතු මුදල මසකට රුපියල් පණහ නොඉක්මවිය යුතුය.

(ආ) එම කම්කරුවා, යම් ලිඛිත නීතියක් මගින් ඔහුගේ වැටුප හෝ වේතනය පාලනය කරනු ලැබ නොමැති කම්කරුවකු වන අවස්ථාවක, මේ නියෝග යටතේ ගෙවිය යුතු දීමනාව, ඔහු මාසික පරිමානයක් මත වැටුප් ගෙවනු ලබන කම්කරුවකු නම් එම කම්කරුවාට මාසය වෙනුවෙන් ලැබිය යුතු වැටුපෙන් සියයට විස්සකට අඩු නොවන්නා වූ ද ඔහු දෛනික පරිමානයක් මත වැටුප් ගෙවනු ලබන කම්කරුවකු නම් මාසය සඳහා, වැඩ කළ එක් එක් දිනය වෙනුවෙන් ඔහුට ලැබිය යුතු දෛනික වේතනයෙන් සියයට විස්සකට අඩු නොවන්නා වූ ද මුදලක් විය යුතුය ;

එසේ වුව ද, මේ නියෝග යටතේ ගෙවිය යුතු මුදල මසකට රුපියල් පණහ නොඉක්මවිය යුතුය.

(ඇ) එම කම්කරුවා, 1975 ජනවාරි මස 19 වන දින හෝ ඉන් පසුව මුල් වරට සේවයෙහි යොදවනු ලැබුවාවූ ද, ඔහුගේ වැටුප් හෝ වේතන යම් ලිඛිත නීතියකින් පාලනය නොකරනු ලැබුවා වූ ද කම්කරුවකු වන අවස්ථාවක මේ නියෝග යටතේ ගෙවිය යුතු දීමනාව, ඔහු මාසික පරිමානයක් මත වැටුප් ගෙවනු ලබන කම්කරුවකු නම් එම කම්කරුවාට මුල් මාසය සඳහා ලැබිය යුතු වැටුපෙන් සියයට විස්සකට අඩු නොවන්නා වූ ද ඔහු දෛනික පරිමානයක් මත වැටුප් ගෙවනු ලබන කම්කරුවකු නම් මුල් මාසය තුළ වැඩ කළ එක් එක් දිනය වෙනුවෙන් එම කම්කරුවාට ලැබිය යුතු දෛනික වේතනයෙන් සියයට විස්සකට අඩු නොවන්නා වූ ද මුදලක් විය යුතුයි ;

එසේ වුව ද, මේ නියෝග යටතේ ගෙවිය යුතු මුදල මසකට රුපියල් පණහ නොඉක්මවිය යුතුය.

(ඈ) (i) එම කම්කරුවා කෑලි ප්‍රමාණයේ වැඩක සේවයේ යොදවනු ලැබ ඇති අවස්ථාවක මේ නියෝග යටතේ ඔහුට ගෙවිය යුතු දීමනාව, මාසය තුළ එවැනි කෑලි ප්‍රමාණයේ වැඩ සඳහා ඔහුට ලැබිය යුතු වේතනයෙන් සියයට විස්සට අඩු නොවන මුදලක් විය යුතුය ;

එසේ වුව ද, මේ නියෝග යටතේ ගෙවිය යුතු මුදල මසකට රුපියල් පණහ නොඉක්මවිය යුතුය.

(ii) යම් කම්කරුවකු 1975 ජනවාරි මස 19 වන දින හෝ ඉන් පසුව කෑලි ප්‍රමාණයේ වැඩක මුල් වරට සේවයේ යොදවනු ලැබූ අවස්ථාවක මේ නියෝග යටතේ ඔහුට ගෙවිය යුතු දීමනාව සේවයේ යොදවනු ලැබූ මුල් මාසය සඳහා ඔහුට කෑලි ප්‍රමාණය මත ලැබිය යුතු වේතනයෙන් සියයට විස්සට අඩු නොවන මුදලක් විය යුතුය ;

එසේ වුව ද, මේ නියෝග යටතේ ගෙවිය යුතු මුදල මසකට රුපියල් පණහ නොඉක්මවිය යුතුය.

(2) මාසය සඳහා සම්පූර්ණ ඉපයුම, රුපියල් අට සියය ඉක්මවන නමුත් රුපියල් අටසිය පණහකට අඩු කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින්ම, රුපියල් අටසිය පණහ සහ එම කම්කරුවා විසින් ඒ මාසය සඳහා ලබන වැටුප හෝ වේතනය අතර ඇති වෙනසට සමාන මුදලක්, 1974 අප්‍රේල් මාසය ද ඇතුලු එක් එක් මාසය වෙනුවෙන් එම කම්කරුවාට දීමනාව ලෙස ගෙවනු ලැබිය යුතුය.

5. 4 වන නියෝගයෙහි සඳහන් යම් කම්කරුවකු වෙත—

(i) යම් සාමූහික ගිවිසුමක විධිවිධාන අනුව හෝ පදනම් කොට ගෙන නැතහොත් කාර්මික ආරාවුල් පනතේ 10(2) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමයක ප්‍රකාර අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂික යක් ; හෝ

(ii) කොළඹ පාරිභෝගිකයන්ගේ දර්ශකය අනුව තීරණය කරන ලද ජීවන වියදම් දීමනාවක්, ගෙවනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එම පාරිතෝෂිකය හෝ දීමනාව වශයෙන් එම කම්කරුවාට ගෙවනු ලබන මුදලින්—

(අ) මාසය සඳහා එම කම්කරුවාගේ සම්පූර්ණ ඉපයුම රුපියල් හාරසියය නො ඉක්මවන අවස්ථාවක එම කම්කරුවාගේ වැටුපෙන් හෝ වේතනයෙන් සියයට දහයකට සමාන මුදලක් හෝ රුපියල් තිහක් යන මේ දෙකින් වඩා අඩු මුදලක් ; සහ

(ආ) මාසය සඳහා එම කම්කරුවාගේ සම්පූර්ණ ඉපයුම් රුපියල් හාර සියයකට වැඩි වන අවස්ථාවක රුපියල් පණහක මුදලක් ;

සේවායෝජක විසින් අඩු කර ගනු ලැබිය හැකිය.

6. යම් කිසි කර්මාන්තයක නියුක්ත යම් කිසි කම්කරුවකුට මේ නියෝග යටතේ ගෙවිය යුතු මුදල යම් ලිඛිත නීතියක කාර්යයන් සඳහා ඔහුගේ වේතනයෙන් කොටසක් සමන්විත වේ යැයි සැලකිය යුතු අතර ඒ අනුව ඒ කම්කරුවාගේ වේතන ගෙවීමට සේවායෝජකයා බැඳී සිටින කාලසීමාව තුළ ඔහු විසින් ඒ මුදල් ගෙවිය යුතුය.

7. 1974 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුවම යම් සේවායෝජකයකු විසින් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කර ගනු ලැබ සිටි සෑම කම්කරුවකුම, ඒ සේවායෝජකයාගේ කම්කරුවකු වශයෙන් ඔහු නොකඩවා සේවය කරන තාක් කල්, 1974 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුවම වූ දිනයෙහි ඔහු භුක්ති විඳිමින් සිටි, වැටුප්, දීමනා හෝ කවර නාමයකින් හෝ අභිධානයකින් වුවද හඳුන්වනු ලබන මුදලෙන් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසිවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි පිට ඒ සේවායෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි යොදවනු ලැබිය යුතු අතර මෙම නියෝග යටතේ ගෙවිය යුතු දීමනාව ඒ වැටුප, දීමනාව හෝ වෙනත් ගෙවීම්වලට අතිරේකව විය යුතුය.

8. 4 වන නියෝගය යටතේ කම්කරුවකුට ගෙවනු ලැබීමට නියමිත මුදල් කිසිවක් ගෙවීම යම් සේවායෝජකයකු විසින් පැහැර හරිනු ලැබීම හේතුකොටගෙන අධිකරණයක් විසින් ඒ සේවායෝජකයා වරදකට වරදකරු කරනු ලැබූ විට, අධිකරණය විසින් ඒ වරද සඳහා නියම කරනු ලැබිය හැකි වෙන යම් දඬුවමකට අතිරේකව, ආඥාවෙහි නිශ්චිතව සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල ඒ කම්කරුවාට ගෙවන ලෙස එම අධිකරණය විසින් ඒ සේවායෝජකයාට අණ කළ හැකි අතර ඒ මුදල එසේ නොගෙවනු ලැබුවහොත් එය අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක් මෙන් අධිකරණයෙහි අණ පිට අයකර ගත හැකිය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම නියෝගවල—

"කොමසාරිස්", "සේවායෝජකයා" සහ "වේතන" යන යෙදුම්වල (136 වන අධිකාරය වූ) පඩිපාලක සභා ආඥාපනතෙහි දී ඇති අර්ථම පිළිවෙලින් විය යුතුය ;

"සාමූහික ගිවිසුම" යන්නට කාර්මික ආරාවුල් පනතෙහි දී ඇති අර්ථයම විය යුතුය ;

"ඉපයීම" යන්නට 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි දී ඇති අර්ථයම විය යුතුය ;

" කර්මාන්තය " යන්නට සේවායෝජකයකු විසින් හෝ කම්කරුවකු විසින් හෝ පවත්වා ගෙන යනු ලබන, ඉටු කරනු ලබන හෝ ක්‍රියාවේ යොදවනු ලබන යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, ව්‍යවසායක්, රක්ෂාවක් වෘත්තියක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මාන්තයක යම් අංශයක් හෝ එබන්දක යම් කාර්යයක් හෝ යම් කාර්ය පද්ධතියක් ඇතුළත්වන නමුත් සේවායෝජකයකුගේ තත්ත්වයෙන් ආණ්ඩුව විසින් මුළුමනින්ම ප්‍රාග් ධනය ප්‍රතිපාදනය කරනු ලැබූ සංස්ථාගත හෝ සංස්ථාගත නොවූ මණ්ඩලයක් හෝ බාලාපරාධකරුවනට හෝ අනාථ දරුවනට හෝ අසරණ, ගොළු, බිහිරි හෝ අන්ධ තැනැත්තන් හට කාර්මික පුහුණුවක් දීමේ කාර්යය සඳහා මුඛ්‍ය වශයෙන් පවත්වාගෙන යනු ලබන යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක් හෝ ව්‍යවසායක් ඇතුළත් නොවේ ;

" කම්කරුවා " යන්නෙන් යම් කර්මාන්තයක, කාර්මික ව්‍යාපාරයක, වෙළෙඳ ව්‍යාපාරයක, රක්ෂාවක හෝ ජීවනෝපායක යම් වැඩක් කිරීම පිණිස වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන ගිවිසුමක් යටතේ සේවායෝජකයකු විසින් සේවයෙහි යොදවනු ලබන තැනැත්තකු අදහස් වන නමුත් ගෘහ සේවකයකු හෝ සේවායෝජකයකුගේ පෞද්ගලික රියැදුරකු එයට ඇතුළත් නොවේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී